# පේරාදෙණියේ වහලේ කොත

සංස්කෘතිය හා චින්තනය යන්න අප ද සිතා සිටියට වඩා වැදගත් බව අපට ද දැන් වැටහෙයි. මාක්ස්වාදීන් ඊනියා මතුමහලෙහි (superstructure) ඇතැයි කියා බාල්දුකර දැමුව ද, සංස්කෘතිය හා චින්තනය යම් මිනිස් වර්ගයක් තුළ ඇති කරන බලපෑම ඉතා විශාල ය. එහෙත් අප නැවත නැවතත් අවධාරණය කළ යුත්තේ බටහිරයන් කරන වැරැද්ද කරමින් සියල්ල සංස්කෘතියට හා චින්තනයට ඌනනය කිරීමෙන් අප වැළකිය යුතු බව ය. සංස්කෘතිය තීරණය වන්නේ හුදු භෞතික සාධක මත පදනම් ව නොවී යැයි අපි කීවෙමු. සංස්කෘතිය ඇතැම් විට භෞතීය සාධක මත පදනම් විය හැකි වුව ද එසේ නොවන අවස්ථා ද ඇත. අනෙක් අතට භෞතික කරුණු සංස්කෘතිය මත පදනම්වන අවස්ථා ද වෙයි.

බෞද්ධ සිද්ධස්ථානවල වහළ බොහෝ අවස්ථාවල කොතක හැඩය ගන්නා අයුරු අප දැක ඇත. ගමේ පන්සලේ බණ මඩුවේ ද, දළදා මාළිගාවේ ද මේ ලක්‍ෂණය දැක ගත හැකි ය. මහනුවර මගුල් මඩුවේ ද ඒ ලක්‍ෂණය වෙයි. රූපයේ දැක්වෙන පරිදි AB හා CD කොටස්වල අනුක්‍රමණයට වඩා BE හා DE කොටස්වල අනුක්‍රමණය (අවශ්‍ය නම් ඒ රේඛා තිරස සමග සාදන කෝණවල අර්ධජ්‍යාය සැළකිය හැකි ය. මේ ලිපි පෙළේ මුල් ම ලිපිය බලන්න) වැඩි ය. බෞද්ධ සිද්ධස්ථානයක වහළක් තනන විට එසේ කොතක හැඩය ලැබෙන අයුරින් අනුක්‍රමණ වෙනස් කිරීමට සිංහල ගෘහ නිර්මාණ ශිල්පියා උනන්දු වූයේ ඇයි? එයට භෞතික වූ හේතුවක් වී ද? මොරටුව විශ්ව විද්‍යාලයේ ගෘහ නිර්මාණ ශිල්ප පීඨයේ චන්ද්‍රසේකර මහතා පෙන්වා දී ඇති අයුරින් එයට හේතුව සංස්කෘතික වෙයි. භෞතික හේතු සැළකුවහොත් වහළට වැටෙන ජලය පොළොවට වැටීමේ දී පහළ කොටස්වල අනුක්‍රමණය ඉහළ කොටස්වල අනුක්‍රමණයට වඩා අඩුවීම ජලයේ චලිතයට බාධාවක් බව පෙනෙයි. එබැවින් භෞතික කරුණු අනුව නම් පහළ කොටස්වල අනුක්‍රමණය ඉහළ කොටස්වල අනුක්‍රමණයට වඩා වැඩි විය යුතු ය. එහෙත් සිංහල ගෘහ නිර්මාණ ශිල්පියා එහි ප්‍රතිවිරුද්ධය මෙහි දී අනුගමනය කර ඇත. චන්ද්‍රසේකර මහතා පවසා ඇති පරිදි එයට හේතුව සංස්කෘතික වෙයි. දළදා මාළිගාවේ වහළ කොතක හැඩය ගන්නා අයුරින් නිර්මාණය වී ඇත්තේ දන්ත ධාතූන් වහන්සේ වැඩ සිටින කුටියට ඉහළින් කොත සිටින අයුරින් ය. එයට හේතුව සිංහල බෞද්ධයා දන්ත ධාතූන් වහන්සේ කෙරෙහි දක්වන ගෞරවය වෙයි. බණ මඩුවේ කොත මෙන් ඇති කොටස නිර්මාණය වන්නේ ධර්ම දේශනා කරන භික්‍ෂූන් වහන්සේට පණවන අසුන ඉහළින් වන ලෙස ය. මෙය නිව්ටන්ගේ හෝ බර්නුලීගේ හෝ නියම නිසා කෙරෙන්නක් නොව එයට විරුද්ධ ව ගොස් ගෞරවය පෙරදැරි කරගෙන සංස්කෘතික ව කරන කාර්යයකි.

පැරණි සිංහල ගෘහ නිර්මාණ ශිල්පියා එසේ නිර්මාණය කරන ලද ගොඩනැගිලි දැකුම්කළු වන බව ද කිව යුතු නොවේ. එහෙත් එහි අරමුණ වූයේ හුදු දැකුම්කළු බව නොවේ. වර්තමානයෙහි ද ගෘහ නිර්මාණ ශිල්පයෙහි දේශීයත්වයක් ගැන කතා කරන ඇතැමුන් පැරණි සිංහල බෞද්ධ සිද්ධස්ථාන අනුගමනය කරමින් ඇතැම් ගොඩනැගිලි සැලසුම් කර ඇති බව පෙනෙයි. බටහිර අනුකරණය කරමින් වීදුරු පෙට්ටි හෝ ග්‍රීක කුළුණු මත ගෙවල් හෝ සැලසුම් කරන ඇංකර ගෘහ නිර්මාණ ශිල්පීන්ට වඩා මේ ශිල්පීන්ගේ වෙනසක් තිබෙන බව පිළිගත යුතු ය. එහෙත් ඔවුහු අවාසනාවකට සිංහල බෞද්ධ සංස්කෘතියෙහි හරය නොදත්තෝ වෙති. ඔවුන්ට පෙනෙන්නේ පැරණි සිංහල ගෘහ නිර්මාණ ශිල්පියාගේ සෞන්දර්යාත්මක පැත්ත පමණ ය. ඒ සෞන්දර්යය පිටුපස ඇති සංස්කෘතිය හා චින්තනය ඔවුන්ට නොපෙනෙයි. කොතක් වැනි වහළක් තනා ඇත්තේ ගෞරවයක් දැක්විය යුතු අවස්ථාවල දී ගෞරවයක් දැක්වීම සඳහා ය. පැරණි සිංහල බෞද්ධ සංස්කෘතියෙහි ගොඩනැගිලි කල් පවතින ආකාරයකින් තනා ඇත්තේ ද වෙහෙර විහාර වැනි පොදු ස්ථාන සම්බන්ධයෙනි. සිංහල බෞද්ධ සංස්කෘතිය ප්‍රභූ සංස්කෘතියක් නොවී ය. මේ කරුණු තේරුම් නොගෙන පේරාදෙණි විශ්ව විද්‍යාලයෙහි ඇතැම් ගොඩනැගිලිවල වහළ කොතක ආකාරයට සැලසුම් කිරීම අනුමත කළ හැක්කක් නොවේ. දේශීය සංස්කෘතියෙහි ආභාසය ගනිමින් ගොඩනැගිලි සැලසුම් කළා යැයි කියන බාවා මහතා වැනි අයගේ නිර්මාණවල ඇත්තේ ප්‍රභූ සංස්කෘතියකි. ප්‍රභූ සංස්කෘතියක් යනු විදග්ධ (sophisticated) සංස්කෘතියක් වීමවත් විදග්ධ සංස්කෘතියක් යනු ප්‍රභූ සංස්කෘතියක් වීමවත් අනිවාර්ය නොවේ. පැරණි සිංහල බෞද්ධ සංස්කෘතිය ප්‍රභූ සංස්කෘතියක් නොවුණ ද විදග්ධ සංස්කෘතියක් විය.

© Prof. Nalin De Silva

ඇතැමුන් මහත් අභිරුචියෙන් වර්ණනා කරන්නේ පේරාදෙණි විශ්ව විද්‍යාලයේ රාමනාදන් ශාලා ගොඩනැගිල්ල හා පුස්තකාල ගොඩනැගිල්ලත් ය. මේ ගොඩනැගිලිවල වහළ පැරණි සිංහල බෞද්ධ සංස්කෘතියේ ආභාසය ලබමින් කොතක ආකාරයට නිර්මාණය කර ඇත. මහවැලි ගඟ අසබඩ හන්තාන කඳුවැටිය පාමුල ඉදිකර ඇති පේරාදෙණි විශ්ව විද්‍යාලය හා එහි ගොඩනැගිලි කියා පාන්නේ අප මුහුණ දී ඇති බෙදවාචකයයි. රූප රාජිනී තරඟවල පොල්තෙල්පහන පත්තු කිරීම වැනි අනුචිත බවක් පේරාදෙණි විශ්ව විද්‍යාලයේ හා එහි ගොඩනැගිලිවල පවතියි. ගොඩනැගිලි දේශීය ගෘහ නිර්මාණ ශිල්පයෙන් ඔපවත් වී ඇතැයි මොහොතකට සිතමු. විශ්ව විද්‍යාලයේ නොයෙක් තැන්වල ඇම්බැක්කේ කැටයම් දක්නට ඇත. බැලූ බැල්මට විශ්ව විද්‍යාලය පුරාම ඇත්තේ දේශීයත්වයයි. එහෙත් එහි කිසිම ගැඹුරක් නොමැත. සමස්තයක් ලෙස ගත්කල, පේරාදෙණි විශ්ව විද්‍යාලයෙන් බිහිවන උපාධිධාරීන්ගේ නොගැඹුරුකම ඉන් සනිටුහන් වන්නාක් මෙනි. (මෙයින් කියැවෙන්නේ අනෙක් විශ්ව විද්‍යාලවල උපාධිධාරීන්ට ගැඹුරක් ඇති බවක් නොවේ.)

පේරාදෙණි විශ්ව විද්‍යාලයේ ගොඩනැගිලිවල දේශීයත්වය ඇත්තේ මතුපිටින් මිස හරය ලෙස නොවේ. ශිෂ්‍ය නේවාසිකාගාරයක් යනු ගුරු කටයුතු පුද්ගලයන් සිටින තැනක් නොවේ. ඇම්බැක්කේ කැටයම් යෙදිය යුත්තේ කිනම් කුළුණක ද? ඒ සියල්ල යහපත් යැයි පිළිගත්ත ද, එහි උගන්වන්නේ කුමක් ද යන ප්‍රශ්නය ඇසීමට සිදුවෙයි. එහි ශිෂ්‍යයන්ට ලැබෙන ආදර්ශය, පණිවුඩය කුමක් ද? පේරාදෙණි විශ්ව විද්‍යාලයෙහි ඉගැන්වෙන දෙයෙහි ඇති දේශීයත්වය කුමක් ද? විජාතික විදේශීය දැනුමක් බොහෝ විට අප රටට සතුරුවන ආකාරයකින් එහි ඉගැන්වෙයි. එහි සිටින බොහෝමයක් ගුරුවරු එක්කෝ කසිකබල් මාක්ස්වාදීහු වෙති; නැත්නම් එවැනි ම වූ කසිකබල් ලිබරල්වාදීහු වෙති. ඔවුහු අනුකාරකයෝ හා අනුකාරකයෝ පමණක් ම වෙති. දේශීය දැනුමක් නුගැන්වෙන පේරාදෙණි විශ්වවිද්‍යාලයෙහි ගොඩනැගිලිවල ඊනියා දේශීයත්වයක් තිබිණි ද ඉන් ඇති ඵලය කුමක් ද?

එහෙත් කලින් කියා ඇති පරිදි පේරාදෙණියේ ගොඩනැගිලිවල ද දේශීයත්වය ඇත්තේ මතුපිටින් පමණකි. පැරණි සිංහල බෞද්ධ සංස්කෘතියෙහි හරය දැනගෙන ඒ ගොඩනැගිලි ඉදිකර ඇතැයි කිසිසේත් ම කිව නොහැකි ය. විශ්ව විද්‍යාලයක දේශීයත්වය ඇත්තේ ගොඩනැගිල්ලක වහළෙහි ඇති කොතෙහි නොව, එහි ඉගැන්වෙන, ඉගෙන ගැනෙන දේ හි ය. පේරාදෙණියේ ඉගැන්වෙන, ඉගෙන ගැනෙන  දේ ගැන අමුතුවෙන් කිවයුතු නොවේ. ගණිකාවක සිල් රෙදි පෙර වූ පමණින් ඇය උපාසිකාවක් වන්නේ නොවේ. බටහිර දැනුම අමු අමුවේ අනුකරණය කරමින් ඒ දැනුම, කිනම් පීඨයක ඉගැන්වුව ද, එය එකම ඊනියා විද්‍යාත්මක දැනුම ලෙස උගන්වමින්, විශේෂයෙන් ම සමාජයීය විද්‍යා පීඨයේ ඉගැන්වෙන බටහිර දැනුම් තහවුරු කිරීම සඳහා අපේ රටේ දත්ත කපා කොටා එයට ගැලපෙන ආකාරයකට ඉදිරිපත් කරමින් රටට කරන හානිය කොත සහිත වහළෙන් වසා ගත හැකි නොවේ.

පේරාදෙණි විශ්ව විද්‍යාලයේ කොතක් වැනි වහළ සහිත ගොඩනැගිලි සංකේතවත් කරන්නේ පසුගිය සිය වසරකට ආසන්න කාලයක් තුළ මෙරට සිදු වූ සංස්කෘතික ගරා වැටීම ය. අප දේශීයත්වය ලෙස දැක්කේ පැරණි සිංහල බෞද්ධ සංස්කෘතියෙහි හා සිංහල බෞද්ධ (ථෙරවාදී) චින්තනයෙහි හරය දැනගෙන එය උකහා ගැනීම නොව ඒ මතුපිටින් අත ගා එහි ආලේපය තවරා ගෙන බටහිර සංස්කෘතික යටත්විජිතවාදය අප මත පටවන දේ අනුකරණය කිරීම ය. පොල්තෙල් පහන, රෙද්ද බැනියම, කිරිබත් ආදිය සංස්කෘතික සංකේත පමණක් බවට පත් වී ඇත්තේ මේ හේතුවෙනි. තරු පහේ හෝටලයක විදේශීය ආධාර හෝ ණය මත යැපෙමින් රුපියල් කෝටි ගණන් වියදම් කර බටහිර දැනුම පිළිබඳ පවත්වන සම්මන්ත්‍රණයක් ආරම්භයේ දී බටහිර ඇඳුමින් සැරසුණු කිහිප දෙනකු, ගුණදාස අමරසේකර මහතාගේ කෙටිකතාවක් සිහි ගන්වමින්, මුළු රටේ ම අනාගතය රුඳී පවත්නේ තමන් කරන දෙය මත ය යන හැඟුමෙන් සිංහල බෙර වාදනය කරන අතර පොල්තෙල් පහන දල්වන්නේ තමන් රවටා ගන්නා අතර අන් අය ද රවටමිනි. පේරාදෙණියේ කොතක් වැනි වහළක් යට ඉදිමින් භික්ෂූන් වහන්සේ ඇසුරේ හැදුණු වැඩුණු තරුණයන් නව ලෝකයට මුහුණ දිය නොහැකි හෙවණැලි මිස මස් ලේ ඇති චරිත නොවන බව පළ කරන නවකතා ලියූ සිරි ගුණසිංහ වැනි හෙවණැලි කෙළේ මානව ශාස්ත්‍රවල ද බටහිර සංස්කෘතික යටත්විජිතවාදය වෙනුවෙන් කඩේ යෑම ය. බටහිරයන් ලංකා විශ්ව විද්‍යාලයෙන් බිහි වූ සිරි ගුණසිංහ වැන්නන් නම් නිකම්ම නිකම් හෙවණැලි බව කල් තබා ම අවබෝධ කර ගත් බවට සැකයක් නැත. ඔවුන් ඒ විශ්ව විද්‍යාලය ආරම්භ කෙළේ ම හෙවණැලි නිර්මාණය කිරීමට ය.

© Prof. Nalin De Silva

සංස්කෘතික සංකේතවලට පමණක් සීමා වීමෙන් සිදු වන්නේ අප අනාථයන් බවට පත් වීම ය. අපේ සංස්කෘතිය අද සංකේත සංස්කෘතියක් බවට පත්වෙමින් ඇත. බටහිර සංස්කෘතික යටත්විජිතවාදය ඉදිරියේ වැඳ වැටෙමින් සිංහල සංස්කෘතික සංකේත කිහිපයක් ප්‍රදර්ශනය කිරීම අද අපේ චර්යාව බවට පත්වෙමින් ඇත. අප සොයා යා යුත්තේ සංකේත නොව හරය ය. අපේ සංස්කෘතියේ හා චින්තනයේ හරය දැනගෙන ඒ මත පදනම් වෙමින් අවශ්‍ය නම් ඒ යම් ප්‍රමාණයකට වෙනස් කර ගනිමින් බටහිර දැනුම ද අවශ්‍ය පරිදි අවශෝෂණය කර ගනිමින් නව දැනුම් නිර්මාණය කර ගැනීම අපේ කාර්යභාරය බවට පත් වී ඇත.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva